කෙටි කතාව



# ප්‍රිය සෙනෙහස

**ශ්‍රියා කුමාරසිංහ** නවසීලන්තය

අයියලට තේරෙන්නෙ නැහැ. මේ හුරතල් බබාල එක්කම ඉන්න නිසා. ඒත් තමන්ගෙ දරු පැටවුන්ගෙ පුංචි කාලෙ එයාලත් එක්ක ඉන්නෙ නැත්නම්, ඒ හුරතල් බලන්නෙ නැත්නම් ඒ තාත්ත කමෙන් ඇති වැඩක් තියෙනවද? ළමයි ලොකු වුනාට පස්සෙ අපි කොච්චර සල්ලි අරන් ගියත් ඒ සන්තෝසෙ ලැබෙන්නෙ නැහැනෙ අයියෙ.

අපි ඔහුට අනිල් යයි කියමු. නම කුමක් වුවත් එහි එතරම් වැදගත් කමක් නැත. ඇරත් ජපානයේදී මුණ ගැහෙන බොහෝ ශ්‍රී ලාංකිකයන් තමා හඳුන්වා දෙන නම් ඔවුන්ගේ නියම නම් නොවන අවස්ථා බොහෝය. එහෙත් මේ ඒ ගැන කතා කිරීමට වෙලාව නොවේ. මට ඔබට කීමට ඊට වඩා හද බැඳගත් කතාවක් තිබේ.

අපට අනිල්ව පළමු වරට මුණ ගැසුනේ හනමසා වෙළඳ සැල තුලදීය. මෙහිදී අප යනුවෙන් හැඳින්වුයේ මාත්, සිරී ත්, චාපා හා වින්ධ්‍යා යන අපේ කුඩා දියණියන් දෙදෙනාත්ය. අපි සෑම ඉරිදාවකම සතියේ කෑම බඩු කලමනා ගැනීමට කසුගා වලට තරමක් දුරින් පිහිටියද හනමසා වෙතටම යාමට පුරුදුව සිටියෙමු. අප සිටින ප්‍රාන්තයේ වෙසෙන විදේශිකයින් අතර එතැන ඉතා ප්‍රසිද්ධය. එලවළු, පලතුරු, මස් මාළු ඉතා ලාබෙට ගත හැකිවාක් මෙන්ම විදේශීය ටින් කෑම හා තායිලන්තයෙන් ගෙන්වන අළුත් එලවළු ද එහිදී මිලට ගත හැකිය. වැඩි වශයෙන්ම මා එහි යන්නේ කංකුං මිටියක්, මුරුංගා කරල් කීපයක් ගැනීමේ උවමනාවෙන් වුවද සිරී නම් වෙළඳ සැලට ඇතුළු වූ තැන සිට මා අනිකුත් අවශ්‍ය දෑ ට්‍රොලියට පටවා ගෙන ඔහු සොයා එන තුරුම ගත කරන්නේ මස් වර්’ග වෙන් කොට ජේලියට තබා ඇති ශීත කාමරයෙහිය. කොතරම් හොඳ නැතැයි කීවද ඔහු මස් කෑම අත් හරින බව නම් පෙනෙන්නට නැත.

එදිනද මා පුරුදු පරිදි තෝරාගත් එලවළු සහ පලතුරු ට්‍රොලියේ අසුරා ගෙන සිරී සොයා යන විට ඔහු තවත් ශ්‍රී ලාංකිකයන් යයි කිව හැකි දෙදෙනෙකු සමග කතා කරමින් සිටියේය. ඉන් එක් අයෙකු සිනමා නළුවෙකු මෙන් ඉතා කඩවසම් පෙනුමක් ඇති තරුණයෙකි. අනෙක් තැනැත්තා තරමක් මැදි වියට කිට්ටු කෙසඟ සිරුරක් ඇත්තෙකි. දෙදෙනාගේම ඇඳුම් පැළඳුම් කියා පෑවේ ලංකාවේ සිට පැමිණ දින කීපයකට වඩා ගතවී නැති සෙයකි. දෙදෙනාම ඒ තරමටම ඉතා ජේත්තුවට හැඳ පැළඳ සිටියහ. ට්‍රොලිය දෙපැත්තේ එල්ලී පැමිණි චාපාත් වින්ධ්‍යාත් තාත්තා දුටු වහාම ට්‍රොලිය අතහැර දුව ගොස් ඔහුගේ දෑතේ එල්ලුනෝය. අමුත්තන් දුටු සැනින් දැරියන් තුලද කුතුහලයක් ඇති වූ බව පෙනුණි. අප දුටු සැණින් කරමින් සිටි කතාව නතර කල සිරී,

ආ මේ එන්නෙ කියන කොටම. මේ පොඩ්ඩී. මේ ලොකු දුව, අර මගෙ නෝනා යි අපව ඔවුන්ට හඳුන්වා දුන්නේය. අපේ කෙනෙක් අළුතින් මුණ ගැසුණ හැම වතාවකම මගේ මුවින් පිටවන පැනය ඒ මොහොතේදීද පිටවුණි. ළඟදි වෙන්න ඇති ආවෙ? ලංකාවෙ කොහෙද ඔයාල?

අම්බලන්ගොඩ. මම නම් ටවුමෙමයි. මේ පාලිත නම් ටිකක් හැරීල යන්න ඕනෙ. සිනමා නළුවෙකු මෙනැයි මට සිතුණ කඩවසම් තරුණයා සිනාබර මුහුණින් පිලිතුරු දුන්නේය. එතකොට ඔයා ගෙ නම?

මම අනිල්.

නිකම් ඉන්න වෙලාවක එන්නකො අපේ ගෙවල් පැත්තෙ. සිරී කියන්න ඇතිනෙ අපි ඉන්න දිහාව. ආදී වශයෙන් සුළු කතාබහක යෙදෙන අතරම ඉතින් අපි යමු නේදැ යි සිරීට ඉඟියෙන් පවසමින් මම මුදල් ගෙවන කවුන්ටරය දෙසට හැරුණෙමි. සිරී තමා අසලම වූ ශීතකරණයේ පියන මත තබා තිබූ මස් පාර්’සල් කීපයක් ට්‍රොලියට දැම්මේය. අමුත්තන් දෙදෙනාද දැරියන්ගෙන් යම් යම් දේ අසමින් සිනාසෙමින් අප පසුපසින් පැමිණියහ. අප වෙළඳසැල තුලින් එලියට පැමිණෙන විට කොහේවත් නොතිබුණු වැස්සක් හිටි හැටියේ කඩා හැලෙමින් තිබුණි. සිරී වැස්සේම දුව ගොස් රථගාලේ නවතා තිබූ මෝටර්’ රථය වෙළඳසැලේ දොරකඩටම පදවා ගෙන ආවෙන් මමද තෙමී ගෙනම අතේ එල්ලා ගෙන සිටි පොලිතීන් බෑග් ටික ඩිකියට දමා ඉදිරිපස දොර හැර ඇතුලට රිංගුවෙමි. චාපාත් වින්ධ්‍යාත් ඒ වන විටත් පසුපස අසුනට ගොඩවී සිටියහ. සිරී රියදුරු අසුන ලඟ දොරේ’ වීදුරුව පහත දමා අනිල් හා පාලිත ඇමතීය.

එහෙනම්.. ඔන්න අපි ගියා. ඔයාල කාර්’ එකක නේද ආවෙ? නැහැ බස් එකේ. ඔහේ නිකම් වටපිටාව බලා ගන්නත් එක්ක එලියට ආපු ගමන්. තව ටිකක් වැස්ස අඩු වෙන කල් ඉඳල බස් හෝල්ට් එකට යනවා. අයියල යන්න. අනිල් සුහද ලෙස කීවේය.

අයියෝ, කලින් කියන්න එපායැ. මං හිතුවෙ වාහනේක ඇවිල්ල කියල තොරීදෙ ඉඳන් ය ආවෙ කිව්වහම. නගින්න නගින්න. මේ වැස්ස කීයට පායයිද දන්නෙ නැහැ. අපි ඔයාලව බස්ස ගෙන යන්නම්.

වැඩි පෙරැ ත්තයකින් තොරව දෙදෙනාම පසුපස අසුනට ගොඩ වූහ. ඉදිරිපස අසුන් දෙක අතරින් රිංගා මා ළඟට ආ වින්ධ්‍යා මගේ උකුලේ වාඩිවුවාය. චාපා මැදි කර ගෙන අනිලුත් පාලිතත් දෙපසින් වාඩිවූහ.

අපි ගෙදර යන පාරේ’ මදක් දුර ගොස් මගින් හැරී සෑහෙන දුරක් ගෙවා ඔවුන්ගේ නවාතැනට ගියෙමු. එය යන්ත්‍ර අමතර කොටස් නිපදවන කුඩා කම්හලක පසුපසට වෙන්නට තනා තිබූ කාමර ජේලියකින් එකකි. එය දුටු මට අවිස්සාවේල්ල පැත්තේ තේ වත්තක කුඩා ලැයිම් කාමර ජේලියක් සිහියට නැගුණි. වෙනසකට වුයේ මේ කාමර වලට කුඩා වීදුරු ජනේල තිබීමත්, අවට පරිසරය තේ වත්තේ මෙන් අපිරිසිදු නොවීමත්ය. වාහනයෙන් බැස ගිය මිතුරන් දෙදෙනා කාමරයට ඇතුළු නොවී අප යන තෙක් සිනා මුහුණින් යුතුව බලා සිටියහ. ගෙදර එන අතර වාරයේ සිරී ගෙන් දැනගත් පරිදි ඔවුන් දෙදෙනාම කිසියම් වෙළඳ සම්මන්ත්‍රණයකට සහභාගි වීම පිණිස කෙටිකාලීන වීසා සහිතව ඔසාකා නගරයට පැමිණි අය වෙති. පාලිත පෞද්ගලික ව්‍යාපාරයක හිමි කරුවෙකු වන අතර අනිල් වෙළඳාම් හා සම්බන්ධ කිසියම් රජයේ දෙපාර්’තමේන්තුවක සේවකයෙකි. අනෙක් අය වැඩමුළුව අවසානයේ සියරට බලා ගොස් ඇති අතර මේ දෙදෙනා ඇතුළු කිහිප දෙනෙක් ආපසු නොගොස් විවිධ නගර වලට විහිදී සැඟවී සිට මේ රැ කියාවට පැමිණ ඇත. එවැනි බොහෝ අයවලුන් මෙයට පෙර මුණ ගැසී ඇති හෙයින් එය අපට එතරම් අමුතු දෙයක් නොවීය.

ඒ මුණ ගැසීමෙන් පසුව අනිල් සෑම සැන්දෑවකම පාහේ අප නිවසට දුරකථන ඇමතුම් දීමට පුරුදු විය. පාලිත ජපානයට ඒමට පෙර සිටම දන්නා හඳුනන හිතවතෙකු තෝකියෝවල සිටියෙන් ඔහු සති අන්තයේ දුම්රියෙන් තෝකියෝ බලා යයි. අනිල් කෙසේ හෝ සිරීගේ සමාගම වඩා ප්‍රිය කලෙන් පාලිත සමග ගමනට එකතු නොවෙයි. සිරීද සිකුරාදා සවස් වන විට අනිල්ගේ නවාතැනට ගොස් ඔහු අපේ නිවසට කැටුව ඒම ක්‍රමයෙන් සාමාන්‍ය දෙයක් බවට පත් විය. එසේ පැමිණෙන ඔහු ඉරිදා මධ්‍යම රාත්‍රිය වන තෙක් අප සමග ගත කරයි. පොඩි එකෙකු මෙන් චාපා හා වින්ධ්‍යා සමග කෙලි සෙල්ලමේ යෙදෙන අනිල්ගේ කවට කම් වලට කුස්සියේ ඉවුම් පිහුම් කරන මටද සිනා පහල වෙයි. ලංකාවේ කෙනෙකු අළුතින් අප සිටින පෙදෙසට පදිංචියට පැමිණියහොත් අවට ඇති සුන්දර තැන් පෙන්වීමට කැඳවාගෙන යාම සිරී පෙර සිටම ඉතා ආසාවෙන් කල දෙයකි. අනිල්ගේ පැමිණීමත් සමග ඒ කාරීයද නැවත ඇරඹිණ.

එසේ යන එන ගමන්වලදී අනිල් සිය පෞද්ගලික ජීවිත තොරතුරු අප සමග නොසඟවා කීවේය. අවුරුදු කීපයක ප්‍රේම සම්බන්ධයකින් පසු විවාහ වූ අනිල්ට හදිසියේම ජපානයට ඒමට අවස්ථාව උදාවී’ ඇත්තේ බිරිඳ ගැබ් ගෙන මාස දෙකක පමණ කාලයේදීය. යම්දෝ නොයම්දෝයි උභතෝකෝටික ප්‍රශ්නයකට මැදිවී සිටි ඔහුට වැඩිහිටි සියල්ලන්ම අවවාද කලේ කලාතුරකින් ලැබෙන මෙම අවස්ථාවෙන් ප්‍රයෝජන ගන්නා ලෙසය. ජපානයට පැමිණි පසුද බොහෝ විට ඔහුගේ සිත තිබුණේ මුහුදින් එතෙර සිය කැදැල්ලේය. ඔහු සෑම ඉරිදාම අපේ නිවසේ සිට සිය බිරිඳට පැයක පමණ දුරකථන ඇමතුමක් දෙයි. අපේ කාමරයේ ඇති දුරකථනයෙන් අපි ඔහුට නිදහසේ කතා කිරීමට ඉඩ හරිමු. ඇමතුම අවසාන කොට කාමරයෙන් එලියට එන අනිල් මඳ වේලාවක් ගත වන තුරු අපෙන් මුහුණ සඟවා ගනී. හොරෙන් අනිල් දෙස බලන මට ඔහුගේ දෑස රතුවී ඇති අයුරු, කඳුළින් බොඳ වී තිබෙන අයුරු පෙනේ. අනිල් පිළිබඳව මා තුල දැඩි අනුකම්පාවක් ඇතිවෙයි. මා ඔහුගේ දුක තුනී කිරීමට උත්සාහ ගන්නේ හැකි තරම් රසවත් ආහාර වේලක් සූදානම් කොට දීමෙනි.

දිනක් අප සියළු දෙනාම කෑම මේසයේ වාඩිවී සිටින අතර මම අනිල් ගෙන් බිරිඳ ගැන තොරතුරු විමසීමි. ඇය ලස්සන ඇති නේදැයි ඇසූ විට ඔහුගේ මුහුණ පුරා පියකරු සිනහවක් ඇඳිණ.